අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය
අංක 1995/02 දරන චක්‍ර ලේඛය

මගේ අංකය : 3(පා. සං) 3/5/95.
අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය,
'ඉසුරුපාය',
බත්තරමුල්ල.

1995 ජනවාරි 02.

සියලුම පාසල්වල විදුහල්පතිවරුන් වෙත.

## පාසල් සංවර්ධන මණ්ඩල අහෝසි කිරීම.

1992 පෙබරවාරි මස 12 වැනි දිනැති අංක 701/12 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් අතිගරු ජනාධිපති සහ අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන අමාත්‍යතුමා විසින්, නිවේදනය කරන ලද "පාසල් සංවර්ධන මණ්ඩල" 1995. 01. 02 දින සිට ක්‍රියාත්මක වන පරිදි අහෝසි කරනු ලැබේ. පාසැල් සංවර්ධන මණ්ඩල ආරම්භ කරන ලද අවස්ථාවේ ක්‍රියාත්මකව තිබූ පාසැල් සංවර්ධන සමිති, අවස්ථාවෝචිත වෙනස්කම්වලට යටත්ව පාසැල් සංවර්ධන මණ්ඩලවලට පැවරී තිබූ වගකීම් ඉටුකරනු ඇත.

1993 සැප්තැම්බර් මස 29 දින මවිසින් නිකුත් කරන ලද යොමු අංක 3/එස් ඩී/3/5/93 සහ 1993 අක19 දරණ චක්‍ර ලේඛය මෙයින් අවලංගු කරමි.

1993 අංක 19 දරන චක්‍ර ලේඛයේ 09:01 වගන්තියට අනුකූලව ආරම්භ කරන ලද පාසැල් සංවර්ධන මණ්ඩල ගිණුම්වල ඇති අරමුදල් පාසැල් සංවර්ධන සමිතිවල ගිණුම්වලට මාරු කළ යුතුය.

1995.01.02 දිනට පසුව පහසුකම් හා සේවා ගාස්තු, වශයෙන් අය කරන මුදල් පාසැල් සංවර්ධන මණ්ඩල පිහිටුවීමට පෙර තිබූ ආකාරයෙන්ම පහසුකම් හා සේවා ගාස්තු ගිණුමේ තැන්පත් කළ යුතුය.

පාසැල් සංවර්ධන සමිතිවල ගිණුම් මෙහෙයවීම, 1992.10.15 දින අංක 2/පාසං/3/8/6/91 චක්‍ර ලේඛයෙන් සංශෝධනය කරන ලද 1982 මාර්තු 30 දින නිකුත් කරන ලද අංක 1982/2 පාසැල් සංවර්ධන සමිති චක්‍ර ලේඛයේ උපදේශවලට අනුකූලව විය යුතුය.

පාසැල් සංවර්ධන සමිතිවලට අදාළ චක්‍ර ලේඛය තවදුරටත් සංශෝධනය කිරීම අවශ්‍යවේයැයි හැඟේනම්, එම සංශෝධන යථාකාලයේදී සිදු කරනු ඇත.

පාසැල් සංවර්ධන මණ්ඩලයට රුපියල් දස ලක්ෂය දක්වා වූ කොන්ත්‍රාත් ඉටු කිරීමට දී තිබූ විශේෂ වරප්‍රසාදය යටතේ රජය හෝ පළාත් බලධාරීන් සමග විධිමත් ගිවිසුම් අත්සන්කොට ඉදිකිරීම් කටයුතු ආරම්භ කළ පාසැල් සංවර්ධන මණ්ඩල 1994.12.31 දක්වාත් එම කටයුතු අවසන් කර නැති නම්, එම කාර්යයන් නිම කිරීමේ අයිතිය අදාළ පාසැල්වල පාසැල් සංවර්ධන සමිතිවලට පැවරේ. එහෙත්, මෙම විශේෂ වරප්‍රසාදය 1995.01.02 දිනයේ සිට පාසැල් සංවර්ධන සමිතිවලට හිමි නොවන අතර, මෙදිනෙන් පසු සියලුම ඉදිකිරීම් සහ සැපයීම් කටයුතු සාමාන්‍ය ටෙන්ඩර් පරිපාටියට අනුකූලව සිදුවිය යුතුය.

මෙම චක්‍ර ලේඛයෙන් පැන නගින කරුණු පිළිබඳ යම්කිසි පැහැදිලි කර ගැනීමක්, අවශ්‍ය වේ නම් මෙම අමාත්‍යාංශයේ අතිරේක ලේකම් පී. ජී. දයාරත්න මහතා ඇමතිය හැකිය. දයාරත්න මහතාගේ දුරකථන අංකය 864863 වන අතර, ෆැක්ස් අංකය 865162 වේ.

පී. ජී. දයාරත්න,
අතිරේක ලේකම් (අධ්‍යාපන සංවර්ධන)

අ. /ක. එම්. ඩී. ඩී. පීරිස්,
අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ,
ලේකම්

පිටපත්

1. විභාග කොමසාරිස් ජනරාල්
2. අධ්‍යක්ෂ ජනරාල් ජාතික අධ්‍යාපන ආයතනය
3. අමාත්‍යාංශයේ සියලුම මාණ්ඩලික නිලධාරීන් වෙත.
4. පළාත් අධ්‍යාපන ලේකම්වරුන්
5. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
6. කලාපීය අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
7. කොට්ඨාශ භාර නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
8. විගණකාධිපති
9. සභාපති, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව
10. කොමසාරිස්, ග්‍රන්ථ ප්‍රකාශන